SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මධ්‍ය නිවේදනය

**2017 ජූලි මස 31**

---

### මීගමුව ආයෝජක හමුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව, “කොටස් වෙළෙඳපොළ නගරයෙන් නගරයට” නමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය හා එහි ප්‍රතිලාභ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ආයෝජක සම්මන්ත්‍රණ මාලාවක් ආරම්භ කරයි. එම සම්මන්ත්‍රණ මාලාවේ පළමු සම්මන්ත්‍රණය 2017 ජූලි 29 වන සෙනසුරාදා මීගමුව ග්‍රෑන්ඩීසා (Grandeeza) හෝටලයේදී පවත්වන ලද අතර ඒ සඳහා දැනට ආයෝජනයේ නිරතවන්නන්, නවක ආයෝජකයන්, වෘත්තිකයන් සහ ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු 250 කට අධික ඉහළ සහභාගීත්වයක් දැකගත හැකි විය.

මෙම වැඩසටහන, කීර්තිමත් වෘත්තිකයන් දෙපළක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අනිල් ප්‍රනාන්දු මහතා සහ එන් ඩී බී සෙකියුරිටීස් ආයතනයේ උප සභාපති - සමීක්ෂණ, සිදත් කළ්‍යාණරත්න මහතා විසින් මෙහෙයවූ ප්‍රධාන දේශන දෙකකින් යුක්ත වූ අතර පිළිවෙලින් ගත් විට මෙහිදී පවත්වන ලද පළමු දේශනය “ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික සමාලෝචනය” සම්බන්ධයෙන් වූ අතර දෙවැන්න “සුරැකුම්පත් වෙළෙඳපොළ ආයෝජන අවස්ථා” පිළිබඳව විය. ඉන් අනතුරුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බාහිර සම්බන්ධතා සහ ආවේක්ෂණ අංශයේ අධ්‍යක්ෂ තුෂාර ජයරත්න මහතා, කොළඹ කොටස් හුවමාරුවේ පර්යේෂණ අංශයේ ප්‍රධානී නිශාන්ත හේවාවිතාරණ මහතා හා ප්‍රධාන දේශකයින් දෙපළද

ඇතුළත් විද්වත් මණ්ඩල සාකච්ඡාවක් පවත්වන ලද අතර සම්මන්ත්‍රණයට සහභාගී වූ ප්‍රේක්ෂකයන් වෙතින් ලැබුණු අසීමිත ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමද විශේෂත්වයක් විය. මීට අමතරව කොටස් තැරැව්කාර සමාගම් සහ ඒකකභාර කළමනාකරණ සමාගම් විසින් නවක ආයෝජයන්ට අවශ්‍ය මූලික ආයෝජන උපදෙස් ලබාදෙන ලදී. කොටස් වෙළෙඳපොළ නගරයෙන් නගරයට සම්මන්ත්‍රණ මාලාව සඳහා ජාතික රූපවාහිනිය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ සමග අත්වැල් බැදගෙන ඇත. මෙම ආයෝජක සම්මන්ත්‍රණ මාලාවේ ඊළඟ සම්මන්ත්‍රණය අගෝස්තු මස 15 වන දින පස්වරු 05.30 ට කොළඹ හිල්ටල් රෙසිඩන්සිස් (Hilton Residencies) හිදී පැවැත්වීමට නියමිතය.


නිකුත් කළේ,

අධ්‍යක්ෂ බාහිර සම්බන්ධතා සහ ආවේක්ෂණ

SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

Level 28-29, East Tower, World Trade Center
Echelon Square, Colombo 01, Sri Lanka
Phone: (+94 11) 2143843 ext 190
Direct (+94 11) 2143834
Fax : (+94 11) 2439149
E-Mail: tushara@sec.gov.lk
Website: http://www.sec.gov.lk